# සුළු අපනයන භෝග සඳහා පූර්ව අපනයන සහතික ක්‍රමය

**ලංකා ප්‍රමිති කාර්යාංශය මගින් ක්‍රියාත්මක කෙරෙන කුළු බඩු සඳහා වන පූර්ව අපනයන ප්‍රශස්තථා සහතික ක්‍රමය අන්තර්ජාතික කුළු බඩු වෙළඳ පොලවල ශ්‍රී ලංකාවේ හොඳ නම රැක ගැනීමට ගත් පියවරක් ලෙස හැඳින් විය හැක. 1974 ජුනි මස කාර්යාංශය මෙම ක්‍රමය අරඹන තුරු කුළු බඩු අපනයනය හුදෙක් වෙළඳ නියෝජිත රටාවේ මනාපය පරිදි සිදු විය.**

මෙම නව ක්‍රමය ආරම්භ කිරීමේ දී ඊට සහභාගි වූ ඇමතිවරුන් දෙපොලක් මෙරටින් යැවූ කුළු බඩු පිළිබඳව එතෙරින් රජයට ලැබුණ පැමිණිලි ගැන සඳහන් කලේ මෙසේ ය. ‘කලු ගම්මිරිස්වල පැපොල් ඇට හා පිටස්තර අපිරිසිදු දේ බහුල යි. සාදික්කා තොග ඇණවුම් කළ රටට ළඟා වන විට පුස්බැඳිලා.’’ මේ අතර කුරුඳු මිටි බර කර වැඩි මිලක් ලබා ගැනීම සඳහා කුරුඳු කුරු තුළටයකඩ ඇණ පුරවා තිබී තමා ගේ අතටම අසු වූ බව එක් ඇමතිවරයෙක් ප්‍රකාශ කලේ ය.

විදෙස් වෙළෙඳ පොලවලට උසස් තත්වයේ බඩු යවන රටක් ලෙස අපේ හොඳ නම රැක ගැනීම සඳහා 1974 සිට ප්‍රමිති කාර්යාංශය මගින් ක්‍රියාත්මක වන පූර්ව–අපනයන සහතික ක්‍රමයේ ක්‍රියා දමය මෙසේ ය. කළු ගම්මිරිස්, සාදික්කා හා වසාවාසි, කරාබු, කොකෝවා, ඇට හා කුරුඳු යන නිෂ්පාදන සහතික ක්‍රමයට අයත් වේ.

අපනයන කරුවකු තමා ගේ බඩු තොගය වර්ගය වර්ග කොට නැව් ගත කිරීමට සූදනම් වූ විට ඔහු කාර්යාංශයෙහි ලියා පදිංචි වී ඇති සමීක්ෂණ සංවිධානයක් මූලික සමීක්ෂණ පැවැත්වීම පිණිස කැඳවිය යුතු ය. මේ සමඟ ම එවැනි සංවිධානයක් කැඳවා ඇති බව ඔහු කාර්යාංශයට දැනුම් දිය යුතුය. බඩු තොගය පිළිබඳව සමීක්ෂණය පැවැත්වීමෙන් පසුව මූලික සමීක්ෂණය පිළිබඳ වාර්තාවේ පිටපතක් සමීක්ෂණ සංවිධානය විසින් කාර්යාංශය වෙත ඉදිරිපත් කරනු ලැබේ. ඉන් පසු කාර්යාංශයේ නිලධාරීන් අපනයනකරුවා ගේ ගුදම් වෙත ගොස් නියැදි තෝරා ගෙන බඩු තොගයේ සියළුම පැකට්ටු සිල් තබනු ඇත. තෝරා ගත් මුළු නියැදි ප්‍රමාණය කොටස් තුනකට බෙදා කාර්යාංශයේ මුද්‍රාව හා අපනයනකරු ගේ මුද්‍රාව යොද සීල් තබනු ලැබේ. මින් එක් නියැදියක් අපනයනකරු වෙත බාර දෙනු ලැබේ. අනෙක් දෙක කාර්යාංශයේ නිලධාරි විසින් තබා ගනු ලැබේ. මින් එකක් ගුණය පරීක්ෂා කිරීමට යොද ගනු ඇති අතර අනෙක් අවශ්‍ය වූ විටෙක පරීක්ෂා කිරීම පිණිස කාර්යාංශයේ තබාගනු ලැබේ.

නියැදි පිළිබඳ පරීක්ෂණයේ ප්‍රතිඵල සතුටු දයක නම් අපනයනකරුවා වෙත සහතිකයක් නිකුත් කරනු ලැබේ. ඔහු විසින් මෙය අපනයන බලපත්‍රය සඳහා ආනයන හා අපනයන පාලක තැන වෙත ඉදිරිපත් කෙරේ.

නියැදි පිළිබඳ පරීක්ෂණයේ ප්‍රතිඵල සතුටු දයක නම් අපනයනකරුවා වෙත සහතිකයක් නිකුත් කරනු ලැබේ. ඔහු විසින් මෙය අපනයන බලපත්‍රය සඳහා ආනයන හා අපනයන පාලක තැන වෙත ඉදිරිපත් කෙරෙන ඉල්ලුම් පත්‍රයට ඇමිණිය යුතුය. අපනයන බලපත්‍රය ලබා ගැනීමෙන් පසුව බඩු තොගය නැව් ගත කල හැකි ය. නැව් ගත කරන අවස්ථාවේ දී රේගු නිලධාරීන් විසින් පරීක්ෂා කරනු ඇත්තේ බඩු තොගයේ පැකට්ටු මත කාර්යාංශය තබන ලද මුද්‍රා නොකඩා ඇත්ද යනු පමණි.

කාර්යාංශය විසින් ලබා ගන්නා ලද නියැදි පිරිවිතරේ අවශ්‍යතාවන්ට අනුකූල

නොවේ නම් කාර්යාංශය විසින් ඒ බව අපනයනකරුවාට දැනුම් දෙනු ලැබේ. එසේ වූ කළ ඔහුට මුළු බඩු තොගයම යළිත් වරක් වර්ග කිරීමට සිදු වනු ඇත. කෙසේ වුව ද බඩු තොගය ගැන කාර්යාංශයේ නිග මනය ගැන ඔහු සෑහීමට පත් නොවේ නම් ඔහුට කාර්යාංශයේ අධ්‍යක්ෂ තැන වෙත අයදුම් කළ හැකි ය. ඔහු පරීක්ෂණයක් පවත් වනු ඇති අතර, ඔහු ගේ තීරණය අවසාන තීරණය වනුයේ ය.

මෙම සහතික ක්‍රමය ක්‍රියාත්මක වීම නිසා සැලසෙන වාසිදයක තත්වයන් මෙවා ය.

1. අපනයන කරන බඩු තොගය වෙළඳාමට හවුල් නැති ආයතනයන් වන ලංකා ප්‍රමිති කාර්යාංශයේ ප්‍රමිතිවලට අනුකූල බවට දෙන ප්‍රශස්ථතා සහතිකය බඩු තොගයේ අනර්ඝත්වය පිළිබඳ ජාත්‍යන්තර වශයෙන් පිළිගැනෙන සහතිකයකි.

2. බාල පහත් තත්වයේ බඩු තොග යවන අපනයන කරුවන්ට ඒ සඳහා තිබූ ඉඩකඩ නැති වී යාම.

3. නිරතුරුවම උසස් තත්වයේ සුළු අපනයන බෝග අපනයනය කිරීමෙන් ලැබෙන විදේශ නාමය නිසා ජාතික ආර්ථිකයට සැලසෙන වාසි ය.